**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 03 - 2021**

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 03 හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව සමඟ 2016 අගෝස්තු 11 දින එළඹි අංක 3348- SRI දරන ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(l) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 03 ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගිවිසුම හා ණය ගිවිසුම අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන - ව්‍යාපෘති 03හි ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - ව්‍යාපෘතියෙහි ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහන - ව්‍යාපෘති 03හි අරමුණ වනුයේ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීම හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහන - ව්‍යාපෘති 03හි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 29,642.60 කට සමාන එජඩො මිලියන 228.02 ක් වූ අතර ඉන් රු.මිලියන 15,990 කට සමාන එජඩො මිලියන 123 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 650 කට සමාන එජඩො මිලියන 05 ක් ආසියානු සංවර්ධන අරමුදලේ විශේෂ අරමුදල් සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඊට අමතරව, රු.මිලියන 7,742.80 කට සමාන එජඩො. මිලියන 59.56 ක් යුරෝපීය ආයෝජන බැංකුව (යු.ආ.බැ) මඟින් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 5,259.8 කට සමාන එජඩො මිලියන 40.46 ක් ශ්‍රී ලංකා රජය විසින් දායකවීමට අපේක්ෂා කර තිබුණි. තවද වැඩසටහන - ව්‍යාපෘති 03හි මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 7,231.90 කට සමාන එජඩො මිලියන 55.63 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 22,410.70 කට සමාන එජඩො මිලියන 172.39 ක මුදලක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 ජුනි 30 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් අනතුරුව වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාල සීමාව 2022 ඔක්තෝබර් 24 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

වැඩසටහන - ව්‍යාපෘති 03හි 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබදව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරණ කලමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 2.3.2 වගන්තියට අනුව ඵලදායි ව්‍යාාපෘති කළමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා පූර්ණ කාලීන පදනමින් බඳවාගත යුතුය. | ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා 2021 පෙබරවාරි 02 සිට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරයා ලෙස උසස් කර ඇති බැවින් චක්‍රලේඛයට අනුව පූර්ණ කාලීන පදනමක් ලෙස ඔහුට රාජකාරී පවරා නොතිබුණි. | හිටපු නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (මහ කොළඹ ජල හා අපජල කළමණාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන) ඉංජිනේරු දම්මික පෙරේරා මහතා පූර්ණ කාලීන පදනමින් ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී. | ඵලදායීව්‍යාපෘති කලමනාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ සැම විටම පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. |

## 3. භෞතික හා මූල්‍ය කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක තුනකින් සමන්විත වන අතර ඒවා නම්, වැඩසටහන් ව්‍යාපෘති 01 හා වැඩසටහන- ව්‍යාපෘති 02 හි මූල්‍ය පරතරය පියවීම සඳහා අතිරේක මූල්‍යකරණය හා ව්‍යාපෘති සංවර්ධන ආධාරක කටයුතු සඳහා අරමුදල් සැපයීම වේ. තවද, ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 38 කට සමාන රු.මිලියන 4,940 ක් වෙන් කර ඇත. ඉන් රු.මිලිනය 4.550 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් ව්‍යාපෘති 01 හා ව්‍යාපෘති 02 හි මූල්‍ය පරතරය පියවීමට අතිරේක මූල්‍යණය සඳහා වෙන් කර ඇති අතර ව්‍යාපෘති සංවර්ධන ආධාරක කටයුතු සඳහා ඉතිරි රු.මිලියන 390 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 3 ක් වෙන්කර ඇත. කෙසේවෙතත්, ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට වසර 05කට පසුව වුවද 2021 දෙසැම්බර් 31 වන විට මිලියන 38 න් සියයට 46.86 ක් නියෝජනය කරන ඇමරිකානු ඩොලර් මිලියන 17.81 කට සමාන රු.මිලියන 3,596.50 පමණක් උපයෝජනය කර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පිළියෙල කොට විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘති සංවර්ධන ආධාරක සංරචකය යටතේ ව්‍යාපෘති සූදානම් කිරීමේ කටයුතුවලට අදාල තනි කොන්ත්‍රාත්තුවල ප්‍රගතිය පහත පරිදි වේ.

**2021 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය**

| සංරචකය/උප සංරචකය | තනි කොන්ත්‍රාත්තු සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් සංඛ්‍යාව | කෙරීගෙන යන කොන්ත්‍රාත් | නිමකල කොන්ත්‍රාත් | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති සංවර්ධන ආධාර | | | | | ව්‍යාපෘතිය නිමකිරීමට බලපෑම | බොහෝ කොන්ත්‍රාත්තූන් ණය කාලය අවසන් වන දිනට පෙර සම්පූර්ණ කළ හැක. ණය කාලය අවසන් වීමට පෙර සෑම ඉතිරිවීමක්ම භාවිතා කිරීමට අපි ඉහළ කළමනාකාරිත්වය සමඟ සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ජා කරමින් සිටී. | කොන්ත්‍රාත්තූන් සම්පූර්ණ කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| I. උපදේශණ කොන්ත්‍රාත් | 10 | 10 | 03 | 07 | | | |
| II. භාණ්ඩ හා සේවා කොන්ත්‍රාත් | 23 | 23 | 04 | 19 | | | |
| III. ටෙන්ඩර් කැඳවීම යටතේ වන කොන්ත්‍රාත් | 21 | - | - | - | | | |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ප්‍රායෝගිකව, ව්‍යාපෘතිවලට අදාල භූතාක්ෂණික සමීක්ෂණ සහ සැලසුම් කටයුතු එකවර සිදු කල යුතුවේ. ඒ අනුව ව්‍යාපෘති සංවර්ධන ආධාර යටතේ වන නව ව්‍යාපෘති 18 ක් සම්බන්ධයෙන් සියළු ශක්‍යතා අධ්‍යනයන්, සැලසුම් හා නිර්මානකරණ කටයුතු අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා 2021 නොවැම්බර් 03 වන දින ලංසු කැඳවා තිබුණි. කෙසේවෙතත්, මෙම නව ව්‍යපෘති පිලිබඳ භූතාක්ෂණික සමීක්ෂණය සඳහා තනි තනි කොන්ත්‍රාත් වෙනුවෙන් ලංසු කැඳවීම් කර තිබුණේ 2021 සැප්තැම්බර් 29 දින වන අතර 2021 දෙසැම්බර් | පැකේජ 18 ම 2022 ජනවාරි මාසයේදී ප්‍රදානය කර ඇති අතර එහි වැඩ කටයුතු සිදු වෙමින් පවතී. | භූතාක්ෂණික සමීක්ෂණ කටයුතු, සැලසුම්කරණ කටයුතු සමඟ සමගාමීව සිදු කල යුතුය. |

31 වන විටත් ඒවා ප්‍රදානය කර නොතිබුණි. එබැවින්, භූතාක්ෂණික සමීක්ෂණවලට පෙර නිර්මානකරණ කටයුතු නිමකර තිබීම හේතුවෙන් ඉහත නව ව්‍යාපෘති සඳහා වූ රුපියල් මිලියන 173 ක භූතාක්ෂණික කොන්ත්‍රාත්තුවල වටිනාකම ඵලදායීවේද යන්න විගණනයට සැකසහිත වේ.

### 3.3 ක්‍රියාත්මක කිරීමේ, ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිම කිරීමේ ප්‍රමාදයන් සහ ව්‍යාපෘති අරමුදල් ඌණ උපයෝජනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඇ.ඩො. මිලියන 38 වන මුළු ණය වටිනාකමින් ඇ.ඩො මිලියන 35 ක් වැඩසටහන් - ව්‍යාපෘති 1, වැඩසටහන් - ව්‍යාපෘති 2 වෙනුවෙන් අමතර මූල්‍යකරණය සඳහා සහ ඉතිරි ඇ.ඩො.මිලියන 3 ව්‍යාපෘති සංවර්ධන ආධාර වියදම් සඳහා වෙන්කර ඇත. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ආරම්භ කර වසර 05 ක් ගතවී ඇතත් 2021 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර ඇත්තේ සියයට 46.87 ක් නියෝජනය කරන ඇ.ඩො. මිලියන 17.81 කට සමාන රු.මිලියන 3,596 ක් පමණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අඩු මුදල් වියපැහැදම් හේතුවෙන් ණය නියෝජිතායතනය විසින් රු.මිලියන 49.29 ක සැලකිය යුතු මුදලක් බැඳීම් ගාස්තු ලෙස අයකර තිබුණි. තවද, වැඩසටහන් ව්‍යාපෘති -2 අදාල කොන්ත්‍රාත් පැකේජ 04 හි අඩු ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපෘතියේ ණය කාලය අවසන් වන 2022 ඔක්තෝබර් 24 වන දිනට පෙර සියයට 53.11ට සමාන ඇ.ඩො.මිලියන 20.19ක ඉතිරි ණය මුදල උපයෝජනය කිරීමේ හැකියාව විගණනයට සැක සහිත බව නිරීක්ෂණය කරන ලදී. | අපි ආසියානු සංවර්ධන බැංකුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉහළ කළමනාකාරිත්වය සමඟ ණය කාලය අවසන් වීමට පෙර ණය මුදල වියපැහැදම් කිරීම සඳහා සාකච්ජා කරන ලදී. ඒ අනුව හැකි ඉක්මනින් රසායනික ද්‍රව්‍ය, ජල සම්බන්ධතා ද්‍රව්‍ය සහ අලුත්වැඩියා ද්‍රව්‍ය මිලදී ගැනීමට තීරණය විය. | ණය කාලය අවසන් වන දිනට පෙර ඉතිරි වැඩ නිම කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතියෙන් ඇ.ඩො.මිලියන 03 ක මුදලක් ප්‍රමුඛතා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර තිබුණි. භූ තාක්ෂණික සමීක්ෂණ සහ භූ විෂමතා සමීක්ෂණ සිදු වුවද, ලේඛණ ඇගයීම හා ටෙන්ඩර් කැඳවීම තවමත් සිදු වෙමින් පැවතීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දින දක්වා කිසිඳු ව්‍යාපෘතියක් ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘති 11 න්, ඉදිරියට කරගෙන යාමට ව්‍යාපෘති 05 ක් තෝරාගෙන ඇත. මෙම ව්‍යාපෘති 5 සඳහා සියළුම ලියකියවිලි සකස් කර ඇත. | සියළුම ව්‍යාපෘති ප්‍රදානය කිරීමට ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.4 ව්‍යාපෘති අරමුණුවලින් පරිබාහිර ගෙවීම් සිදුකිරීම

| අංකය | විගණන නිරීක්ෂණ | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය සඳහා ජ්‍යේෂ්ඨ ඉංජිනේරුවකු රුපියල් 180,000 ක මාසික වැටුපකට බඳවාගෙන තිබුණි. කෙසේවෙතත්, ඔහු දැනට ක්‍රියාත්මක අළුත්ගම, මතුගම, අගලවත්ත ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ කෙත්හේන ජල පවිත්‍රාගාරයේ වැඩ අධීක්ෂණය සඳහා අනුයුක්ත කර ඇති අතර ව්‍යාපෘතියේ කටයුතුවලට සහභාගී නොවී 2021 ජූනි සහ 2021 නොවැම්බර් මස අතර කාලයට අදාලව රුපියල් මිලියන 1.08ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා ඇත. | ආදායම් නොලබන ජලය, මෙහෙයුම් සහ නඩත්තු කටයුතු හා සම්බන්ධීකරණ කටයුතු වැනි ව්‍යාපෘති ක්‍රියාකාරකම් වලට ඔහු සහභාගී විය. | ව්‍යාපෘති අරමුණුවලට අනුකූලව ව්‍යාපෘති අරමුදල් යෙදවීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘති සංවර්ධන ආධාරක සංරචකය යටතේ රු.මිලියන 9.16 ක පිරිවැයකට නීති විශේෂඥයින් දෙදෙනකු සහ ප්‍රසම්පාදන විශේෂඥයින් දෙදෙනෙකු සමඟ තනි උපදේශණ කොන්ත්‍රාත්තුවලට එළඹ ඇත. ඉන් රුපියල් 667,000 ක් ගෙවා තිබුණේ ව්‍යාපෘති විෂය පථයෙන් බැහැරව දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අනෙකුත් ජල සම්පාදන හා අපජල ව්‍යාපෘති 05 ක් සඳහා වන ප්‍රසම්පාදන හා නීතිමය ගැටළු සම්බන්ධ උපදේශණ සේවා ලබා ගැනීම සඳහාය. | ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ඇතිව දීප ව්‍යාප්ත ව්‍යාපෘති සඳහා 3 වන අදියරේ ඩොලර් මිලියන 3ක මුදලක් වෙන්කර ඇත. | ව්‍යාපෘති අරමුණුවලට අනුකූලව ව්‍යාපෘති අරමුදල් යෙදවීමට කටයුතු කල යුතුය. |

### 3.5 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණ | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරණ චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ ගනුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් නොවීය. | මේ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනය විසින් පිළිතුරු දෙනු ඇත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |